# කර්ම දායාදය

සංස්කාරක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

ධර්ම දානය :

බූන්දල පදිංචි දායක පිරිසක් විසින්

# මිහිකත කම්පා වී

කුසිනාරාව ඇත සොමි කිරණින් නැහැවී
විහඟුන් නිසල විය රුක් ගොමුවල තනිවී
නිහඬය සෝබරය ගහකොළ නොම සෙලවී
සල්රුක් මලින් බර විය වෙනසක් පලවී

මාහිමි පානගති උයනෙහි කෙළ වරට
සල්මල් පතිත විය ඔබ සිරි පතුල වට
ආනන්දයෙනි සකසනු මේ අසුන මට
තිලවග මැණික සැතපින ඒ අසුන පිට

අනදය මගේ කය පමණක් නොව මෙලොවේ
ලොව ඇති සියල්ලම අනියත බව පලවේ
මා දෙසු දහම පිළිපැද ජය ගෙන දෙලොවේ
සදහට ලබනු සැනසිලි සුව ජය එය වේ

දෙව් බඹ මිනිස් සේනා සෝ සයුර මැද
පසුවෙති ගුවන් තලයට දුක් සුසුම් බිඳ
මිහිකත පවා කම්පනයෙන් යුතුව තද
කැළඹී ගියා බුදු දෙන යන වැයුනු සඳ

# කර්ම දායාදය

සංස්කාරක :

**අකුරේගොඩ රතනසාර හිමි**

ධර්ම දානය :

**බූන්දල පදිංචි දායක පිරිසක් විසින්**

# අනුග්‍රහය

"සියළුම දානයන් අභිබවා ධර්ම දානයම උතුම් වන්නේය." යි අප තථාගත "ගෞතම" සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් වදාළ සේක. එය අවබෝධ කරගත් බුන්දල පදිංචි පිරිසක් විසින් ක්‍රි. වෂී 2009 අප්‍රේල් මස 25 වන දින හදිසියේ අකල් මරණයට ගොදුරු වූ ඩබ්. පී. විකුම් සුදෙස් කුමාර මහතාගේ සසර ගමන ඉදිරියේදී මෙවන් අකල් මරණයකට පත්නොවී ඉක්මන් භවයකින්ම නිවන් සැප පතා මෙම ධර්ම ග්‍රන්ථය සඳහා අනුග්‍රහය කරන ලදි.

එසේම මෙවන් ධර්ම ග්‍රන්ථයක් සඳහා අනුග්‍රහය දැක්වීම ඉතා උතුම් බෞද්ධ සිතිවිල්ලක් ක්‍රියාවට නැංවීම තුලින් මෙවන් කුඩා ධර්ම මගින් සමාජයට නිහඬ සේවයක් කරන එම පින්වතුන්ට සසරගමනට අවශ්‍ය මග වියදම වූ ප්‍රඥාව ලබා ගනිති.

# පුණ්‍යානුමෝදනාව

කර්ම දායාදය නම් වූ මේ කුඩා දහම් පොත පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසින් සකස්කොට ඇත. පුණ්‍යවන්ත ජීවිතයක මහිමය මෙයින් ප්‍රකාශ වේ. දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබා ගැනීම සඳහා නිර්වාණ සම්පත්තිය ලබා ගැනීම සඳහා පින අත්‍යාවශ්‍යය. පින් කරගැනීමට මැලි වූවෝ සැමදා දුක් විඳිති. අප්‍රමාදයෙන් කටයුතු කළ සියළු දෙනා ශ්‍රේෂ්ඨත්වයට පත්විය.

මේ ධර්ම දානමය පින මුද්‍රණ වියදම් දැරූ සියලු දෙනාටත්, පරලොව ගිය සැමටත් අත් වේවා. ඒ සැමගේ ජීවිත සැපවත් වේවා. නිවන් සුව අත්වේවා. දෙවියන්ටත් මේ පිං බලයෙන් යහපතක්ම වේවා.

අපවත් වී වදාළ අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන මාහිපාණන් වහන්සේට මේ උතුම් පින බුදුබව පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

අතිගරු පූජනීය මහා කම්මට්ඨානාචාර්ය නා උයනේ අරියධම්මාභිධාන නායක මාහිපාණන් වහන්සේටද මහ සංඝ රත්නයටද, පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේටද සෝවාපත් බැලූ පූජ්‍ය බේරුවල බෝධිවංස ස්වාමීන් වහන්සේටද නිරෝගී සුව දිගාසිරි ලැබේවා. සියලු ප්‍රාර්ථනා සඵල වේවා යි ආශිර්වාද කරමි.

මෙයට,
කාරුණික,

**කහගොල්ලේ සෝමවංස හිමි.**

ගල්දූව ආරණ්‍ය සේනාසනය
කහව
2013. 05. 13

# පසු වදන

කර්මය සත්වයාට දායාදයක් සේ ලැබෙන බව තථාගත දේශනයයි. හොඳ කර්ම කරන අයට හොඳ විපාක සහ නරක වැඩ කරන අයට නරක විපාක ලැබෙති. කර්ම විපාක ගැන ඉතා හොඳ ධර්ම ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ මූලික වීම සෑම දෙනාටම ආදර්ශ සම්පන්න බව නොකියා බැරි කරුණකි. උන්වහන්සේට ගිහි සමාජය හා පැවිදි සමාජය ගැන මනා අවබෝධයක් ඇත. නිතරම අයුක්තිය පිටු දැකීම මෙන්ම යුක්තියට ගරුකරන උන්වහන්සේ කාලීන අවශ්‍යතාවයක් ගැන සිතා මෙම පොත මුද්‍රණය කොට ඔබ අතට පත්කරනු ලබන්නේ අසීමිත සාසන ගෞරවයෙන් යුතුවයි. මෙම පොත හොඳින් කියවා තේරුම් ගෙන සසර බිය උපදවාගෙන සසර කතරින් එතෙර වීමට නොපමාව කටයුතු කළ යුතුයි.

මෙම ධර්ම දානමය මහා පින, සම්පාදක පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට නිරෝගී සුව දිගාසිරි පිණිස වේවා ! උපකාර කළ සියලු දෙනාටත් දහම් පොත පරිශීලනය කරන ඔබ සැමටත් නිදුක් නිරෝගී සුව වේවා ! ඔබ අප සැමට සසර දුක් තරණයෙන් ලබන අමාමහ නිවන් සුව ලබනු පිණිස මෙම ධර්මදානමය පින උපකාර වේවා ! යි ප්‍රාර්ථනා කර ගනිමු.

සියලු සතුන් ලොව සුවපත් වේවා !

මීට,
කාරුණික

ලග්ගල කල්‍යාණවංස හිමි

ගලදූව ආරණ්‍ය සේනාසනය
කහව,
අම්බලන්ගොඩ.
2013. 05. 13

## සංස්කාරක හිමිගෙන්....

මෙතෙක් සම්පාදනය කර මුද්‍රණය කර බෙදාහරින ලද පොත් අටෙන් (8) නව වන (9) පොත වන මෙම පොතෙනුත් ඔබට දෙන දහම් පණිවිඩය සම්බුද්ධ ශාසනය පිරිහීම ආරම්භ වූ මෙම කාල වකවානු තුල බුදුරජාණන් වහන්සේම වදාළ පරිදි "කළියුග කාලයෙහි මාගේ ශ්‍රාවකයන් ධර්ම දේශනා පවත්වනු ලබන්නේ බව තෘෂ්ණාව ඉස්මතු වන ආකාරයටයි. මාගේ දේශනාව තෘෂ්ණාවෙන් මිදී සංසාර ගමන නැවැත්වීම පිණිසයි" මේ කාලවකවානුව තුළ පෘතග්ජන ජනයාහට (සුදුවට සහ සුරාවට වහල්වූ ආකාරයට) ධර්මාවබෝධය හීනකම නිසා භව තෘෂ්ණාව අපේක්ෂාවෙන්ම පිං දහම් කරති. මෙම දහම් ග්‍රන්තය සතර අපා අටමහ නිරයන් ගැන තිබෙන විස්තර කියවන්න කැමැත්තක් නොදක්වයි. එසේ නොසිතන්න ඔබ මෙම ග්‍රන්ථය නැවත නැවත කියවන්න එවිට ඔබට යථා තත්ත්වය අවබෝධ වී ලබාගත් උතුම් මිනිස් භාවයෙන් පරලොව වශයෙන් හොඳ සුගති ආත්ම භාවයක් ලබා ඊළඟ බුද්ධ ශාසනයෙන් දුක් සංසාර ගමන නිමා කිරීමේ භාග්‍යය උදාවේ.

### ආලෝකයෙන් ආලෝකයට

මෙහි අග පිටකවරයේ සිටින පින්වත් මහත්මයාගේ උතුම් සත් ක්‍රියාව බලන්න. කිසිම කෙනෙකුට අවබෝධ නොවූ ශ්‍රේෂ්ඨ ආදර්ශමත් සත්ක්‍රියාවක් වූ වැල්ලවාය ප්‍රාදේශීය සභාපති වූ රෝහණ වන්නිආරච්චි මහතාගේ එම සත්ක්‍රියාව නිසා ක්‍රි: වර්ෂ 2013 අවුරුද්දේ ගවයන් (3000) තුන්දහසකට අභය දානය ලැබුනේ මස්කඩ මුදලාලිගේ අතට මරණයේ ලණුව දිනය හිංසාකාරී ගමන, ආහාර පාන, වධකයන්ගේ තාඩන පීඩනාදියවත් නැතිවය. එපමණක් ද එය ආදර්ශයට ගත් මෙරට බෞද්ධයෝ මේ වන විට එය කොපමණ දුරට ගොස් තිබේද යනු අවුරුදු 148 ක් පැරණි දළදා වහන්සේ වැඩ සිටින දිසාවේ සත්ව ඝාතනාගාරය වසා දැමුණි. අවුරුදු සියයකට වැඩි කාලයක් දෙමටගොඩ මා හොඳින් දන්නා පරිදි ඉතා කෲර තිරිසන් වධ දිදී මරපු හරක් ගැන සත්‍ය විස්තරයක් රටට පෙන්වා දුන් බොදුබල සේනාව සහ පානදුරේ මෙම අවුරුද්දේ මස් ටෙන්ඩරය භික්ෂූන් වහන්සේලා නිසා වැල්ලවායේ තත්වයට පත්කිරීම ආදී අප දන්නා නොදන්නා තවත් ඉහත සඳහන් ආලෝකයෙන් ආලෝකයට යන ආදර්ශය දුන් රෝහණ වන්නිආරච්චි මහතා ආදර්ශයට ගන්න.

තවද ඉහත සඳහන් නිරයන්ගෙන් මිදීම සඳහාත් "උපා දන්නා අය අපායේ නොවැටෙති" යනුවෙනි. පැරණි ගැමි කියමනක් ඇත. එය මිලින්ද ප්‍රශ්නය මෙසේ සඳහන්ව ඇත. වැඩි විස්තර සඳහා "මිලින්ද ප්‍රශ්නය" මහා පොත් වහන්සේ කියවා බුද්ධි වර්ධනය කරගන්න. එය මෙසේ යි :- එදා

නාගසේනා මහරහතන් වහන්සේගෙන් මිලිඳු රජතුමා මෙසේ විමසිය "ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යම් යම් පාපකර්මයන් කරගත්තවුන් අපායේ නොවැටී එයින් මිදීමක් නැත්ද?" යි විමසිය. එවිට නාගසේන මහා ස්ථවිරයන් වහන්සේ මෙසේ උපමාකර වදාළ සේක. "මහරජතුමනි, ඉතා කුඩා ගල්කැටයක් සාගරයකට දැමුවොත් මොකද වෙන්නේ. අතරමග රැඳීමක් නොමැතිව සාගර පතුලටම ගිලා බසින්නේය. එවන් බර වස්තු විශාල ප්‍රමාණයක් පටවා ගත් නෞකාවක් යම්කිසි වරායක සිට නැව් කපිතාන්ගේ අරමුණක් වූ වෙනත් දේශයක වරායකට යාමට අදහස් කළොත් මොකද වෙන්නේ" "ස්වාමීනි, ඔහුගේ සිතැඟි පරිදි නිරුපද්‍රිතව සාගරය හරහා අරමුණු වරාය කරා යන්නේය." යි පැවසිය. "එය එසේ නම් මහරජතුමනි, මෙලොව ජීවත්වන සත්වයෝ පඤ්චානන්තරී පාපකර්මයක් හෝ නියත මිථ්‍යා දෘෂ්ටි නොගෙන වෙන වැරදි පාපකර්ම කරමින් සිටියදී යම්කිසි දවසක මම මේ කරන්නේ වැරදි ක්‍රියාවක්, පහත් ක්‍රියාවක් බව තේරුම් ගෙන එයින් මිදී යහමඟ ගමන් කරමින් බොහෝ කුසල් කරගත්තොත් ඔහුද සතර අපා දුකින් මිදෙන්නේය."

එසේම ඉහත සඳහන් රෝහණ වන්නිආරච්චි මහතාද තමන්ගේ ජීවිතය ආලෝකයෙන් ආලෝකයට ගෙන යන ආදර්ශයට අපි සැවොමත් භුක්ති විඳිති. එම ප්‍රවෘත්තිය "අද" පුවත්පතේ පළවී තිබෙනු දුටු වහාම මගේ තිබුණු සියලු වැඩ නවතා එතුමා බුද්ධ පුත්‍රයෙකු වශයෙන් මම ආශිර්වාද කළෙමි. එවිට එතුමා මා වෙත මෙසේ දන්වා සිටියා. "ස්වාමීන් වහන්ස, මේ වන විට විහාරස්ථාන 28 කින් මට ආශිර්වාද තිබෙනවා. ඔබ වහන්සේලා මෙසේ පැමිණ මට කරන මෙම ආශිර්වාදය මගේ සිත තව තවත් ධෛර්‍යමත් කිරීමක් කියා සතුට ප්‍රකාශකළෙමි. නැවේ උපමාව මෙයින් සිතාගන්න. එදා 999 ක් මිනී මැරුම් කෑ පුද්ගලයින් නොව එම මිනීමරු අංගුලිමාල බුදු ඇසට දර්ශණය වූයේ පෙර පින් බලය මෙලොව වාසනාව නිසාය. එයාකාරයට මේ පින්වත් මහත්මයා සේම තවත් ඔවුන් යුතුකම් චාරිත්‍ර වාරිත්‍ර ඉටුකරන අයගේද කෝටියක් දෝස භංග කරන උත්පත්ති නිවන් දක්නා ජාති දක්වා සසර ගමනේදී පසුපස පැමිණ පිහිට වන්නේය. සැම සත්වයන්ටම ධර්මාවබෝධය වේවා !!!" පතමි.

මීට,
මෙතැති,

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

ශ්‍රී විසුද්ධාරාමය,
බූන්දල, හම්බන්තොට.
2013. 04. 15

නමෝ තස්ස භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

**ශ්‍රී බුද්ධ වර්ෂ 2552 නිකිණි පුර පසළොස්වක පෝ දිනට පෙර දින නොහොත් රාජ්‍ය වර්ෂ 2009.08.03 වන දින**

පින්වත්නි,

මෙම දහම් ග්‍රන්ථය බුද්ධියට ගෙන යම්කිසි දැනගත යුතු එකතු කරගත යුතු තේරුම් ගතයුතු නුවණ දියුණු කරගෙන මතකයේ තිබෙන කුණු කන්දල් වෙනුවට සාරවත් යහපත් මෙලොව පරලොව සැප විපාක ලැබෙන්නා වූ මනුෂ්‍යයා පමණක් නොව සෑම ප්‍රාණියෙකුටම මෛත්‍රී සිත පැතිරවීමේ උතුම් මිනිස් ගුණ සිහිපත් කර දෙන දහම් ග්‍රන්ථයකි.

මෙහි මුලින්ම සඳහන් වන්නේ 2009 මැයි 08 වන දින පළකරන ලද වෙසක් බුදුසරණ පත්‍රයේ පලවී තිබුණු පූජ්‍යපාද නාවල ධම්මානන්ද හිමියන්ගේ නමින් පළවී තිබූ "කර්මය පිළිබඳ අගනා දෙසුමක්" වූ "චූලකම්ම විභංග සූත්‍ර" දේශනාව ඇතුලත් ලිපියකි.

"ධමම දායද භිකඛවෙ භවත මා ආමිස දායාද"

"මහණෙනි, ධර්මයට දායාදව වූ ආමිසයට දායාද නොවව්,"

සකල සත්වයාගේ සියලුම ආමිස ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වන්නාවූ ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි "සුභ" නම් මානවකයෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත්පස්ව හිඳ සුහද කථාවෙන් පසුව මෙසේ විමසීය.

"පින්වත් ගෞතමයන් වහන්ස, මනුෂ්‍යයන් අතර විවිධ උස්පහත්

ගනිද, විවිධ රෝගාබාධ නිරෝගිභාවයන් වණ්, දුවණ්, උස්පහත්, ධන සම්පත්, දාන සම්පත්, මන්ද බුද්ධික, අඳ, ගොළු, බිහිරි, අංගවිකල, අකල් මරණ, පුණ් ආයුෂ පරිවාර සම්පත් කිසිවකුගේ පිළිසරණක් නොමැති සමාජයක් වීමට හේතුව කුමක්ද?"

"පින්වත් මානවකය, සසර සැරිසරන්නාවූ සත්වයෝ වනාහි තම තමන්ගේ කර්මය තම තමන් සතුකොට ඇත්තාහ. එසේම කර්මය දායාදකොට ඇත්තාහ. කර්මය උපතට හේතුකොට ඇත්තාහ. කර්මය පිළිසරණ කොට ඇත්තාහ මෙකී සියළු වන්නේ කර්මබලය නිසාය."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කරුණු අවබෝධ කරගැනීමට නොහැකි වූ මානවක තෙමේ එය විස්තර කර දෙන ලෙස භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කල කල්හි භගයවතුන් වහන්සේ එය මෙසේ විස්තර වශයෙන් වදාළ සේක.

1. මානවකය මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් සතුන් කෙරෙහි අකාරුණිකව මැරීමෙහි යෙදෙයි. එයින් රැස්කරගන්නා වූ අකුසල කර්මය හේතුකොට ගෙන එම ස්ත්‍රිය හෝ පුරුෂයා දුක් ඇති නිරයෙහි උපත ලබයි. යම් හෙයකින් නිරයෙහි උපත නොලබා නැවත මෙම මිනිස් ලොව උපන්නේ නම් අල්පායුෂ වෙයි. මානවකය සතුන් කෙරෙහි අකාරුණිකව හිංසා පීඩාදියට පමුණුවා මැරීම අනුව පාපය උස් පහත් වෙයි.

2. මානවකය, මෙලොව යම් කෙනෙක් සියළු සත්වයන් කෙරෙහි අනුකම්පාවෙන් යුතුව පාපයට ලැජ්ජා භය ඇතිව ප්‍රාණඝාතයෙහි වැළකී වාසය කරයි. එම හේතුව කරණකොට ගෙන එම ස්ත්‍රිය හෝ පුරුෂයා මරණින් මතු සුගතියෙහි උපත ලබයි. එසේ සුගතියෙහි උපත නොලබා නැවත මිනිසත් ආත්ම භාවයෙහි උපන්නේ නම් දීර්ඝායුෂ සමඟම නිදුක් නීරෝගී මනා සිහිකල්පනාවෙන් යුතු පියකරු කෙනෙකු වෙයි.

3. මානවකය, මෙලොව යමෙක් අතින්, පයින්, ගල් මුගුරු, ආයුධ ආදියෙන් සතුන්ට හිංසා ඇතිකිරීමෙහි හිංසා පීඩා කිරීමෙහි යෙදෙයි. එයින් රැස්කර ගත්තාවූ අකුශල පාපකර්මය හේතුකොට ගෙන ඔහු හෝ ඇය මරණින් මතු සැපයෙන් තොරවූ දුක් ඇති නිරයෙහි උපත ලබයි. නිරයෙහි උපත නොලබා මිනිස් ලොව උපදිනම්, නොයෙකුත් රෝගාබාධ බහුල ඇත්තෙක් වෙයි. මානවකය, එසේ හිංසා පීඩාදිය කිරීම බොහෝ රෝගාබාධවලට හේතු වේ.

4. මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් සතුන්ට හිංසා පීඩා කිරීමෙන් වැළකී මෛත්‍රී සිත පතුරවත්නම් ඔහු මරණින් මතු සුගතිගාමී වෙයි. එසේ නොවුවහොත් නැවත මිනිසත් ආත්ම භාවයක් ලබයි. එසේ මිනිසත් ආත්ම භාවය ලබන්නා වූ ඔහු හෝ ඇය නොයෙකුත් රෝගාබාධයන්ගෙන් තොරව නිරෝගී සුවය අල්පාබාධ ඇත්තෙක් වෙයි.

5. මානවකය, මෙලොව යම් කිසිවෙක් ක්‍රෝධකරන ගති ඇතිවූයේ සුළු කරුණකින් පවා ගැටෙමින් කිපෙමින්, කෝපයෙන් නොසතුටක් පළකරයි. එයින් රැස්කරගත් ඒ අකුශල කර්මය හේතුකොට ගෙන එම පුද්ගලයා මරණින් මතු නිරයෙහි උපත ලබයි. නිරයෙහි උපත නොලබා මිනිස්ලොව උපදිනම් ඒ ඒ තැනදී ඔහු දුර්වර්ණී වෙයි. මෙසේ වීමට හේතුව ක්‍රෝධ කිරීමේ විපාකයි.

6. මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ වෛර නොකරන සුළු වූයේ මහත් කරුණකින් පවා නොගැටමින් නොකිපෙමින් කෝපයත් තරහවත් නොසතුටත් පළනොකරයි. මෙසේ රැස්කරගත් එම කුසල කර්ම හේතුකොට ගෙන මරණින් මතු සුගතියෙහි උපත ලබයි. යම් හෙයකින් දෙව්ලොව නොඉපිද නැවත මෙම මනුලොව උපදිනම් උපදින ඒ ඒ තැන්හි මහත් ප්‍රසාදනීය ස්වරූපයෙන් යුක්ත වෙයි.

7. මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ඊර්ෂ්‍යා කරන සුළුවෙයි, අන්අයගේ ලාභ, සත්කාර, ගරු බුහුමන්, දියුණුව බලා සිටීමට නොහැකිව ඊර්ෂ්‍යා කරයි, ද්වේෂකරයි, එම හේතුවෙන් ඇතිකර ගන්නාවූ පාප අකුසල කර්ම බලයෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුක්විපාක දෙන නිරයෙහි උපත ලබයි නිරයෙහි උපත නොලබා නැවත මිනිසත් භාවයෙහි උපන්නෙහි නම් ඔහු හෝ ඇය අල්පේශාක්‍ය වීමට හේතු වෙයි. එවිට පෙර ආත්මයෙහිදී පුරුදුකළ ඊර්ෂ්‍යා ක්‍රෝධ, මාන්න තව තවත් බලවත් වීමෙන් මරණින් මතු දුගතියටම පත්වෙයි.

8. මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අනුන් කෙරෙහි ඊර්ෂ්‍යා, ක්‍රෝධ, මාන ඇති කර නොගනිත්ද, මෙත් වඩත්ද, ලදදෙයින් සතුටුවෙත්ද යස ඉසුරු සැප සම්පත් භුක්ති විඳින අය දෙස බලා සතුටුවෙත්ද, එම කුසලකර්ම බලයෙන් මරණින් මතු මනා සැප සම්පත් ඇති දෙව්ලොව උපදී. නොඑසේ නම් නැවත මිනිස් ආත්ම භාවයක් ලද්දේ නම් ඒ අය මහේශාක්‍ය තත්ත්වයටද සියළු යස ඉසුරු පරිවාර සම්පත්ද ලබති.

9. මානවකය, මෙලොව යමෙක් පැවිදි උතුමන්ට ආහාර පාන වස්ත්‍ර බෙහෙත් හෝ වෙනත් අවශ්‍ය දෑ නොදෙන සුළුය. එසේ වන්නේ ඔහුගේ සිතේ තිබෙන තද මසුරුකම නිසාය. ඔවුන් මරණින් මතු දුක් ඇති නිරයෙහි උපත ලබත්, එසේ නොමැතිව නැවත මිනිස් ආත්ම භාවයක උපත ලබත්, ඔහු ඉතා දුගී දුප්පත් අල්ප භෝග ඇත්තෙක් වෙයි. මෙය මසුරුකම නිසා දන් නොදීමේ විපාකයි.

10. මානවකය, මෙලොව යමෙක් මසුරුකමෙන් තොරව පැවිදි උතුමන්ට ශ්‍රද්ධා භක්තියෙන් යුතුව ඉතා අල්ප දෙයක් වුවද පූජා කිරීමෙන් මහත්ඵල මහානිසංස කුසල් රැස්කරගෙන මරණින් මතු නිදා පිබිදියාක් මෙන් මනා සැප ඇති දෙව්ලොව උපදී. එසේම ගරුකළ යුත්තන්ට ගරු සත්කාර කිරීමෙන්ද මව්පිය උපස්ථානය කිරීමෙන්ද

දීර්ඝායුෂ සියළු සැප සම්පත් වලට හිමි මිනිසත් භාවයද ලබති.

11. මෙසේ ඉහතින් පෙන්වූ කරුණු කාරණාවලින් තොරව අධික මානය නිසා පිදිය යුත්තන් නොපුදා ගරු සත්කාර වෙනුවට ඇනුම් බැනුම් ගැරහුම් කරත්ද, ඔහු හෝ ඇය මරණින් මතු දුගතියෙහි උපත ලබා ශෙෂකර්ම විපාක වශයෙන් මිනිසත් භාවයන් ලද කල්හි පහත් කුළවල උපදී.

12. මානවකය, යම්කිසි මනුෂ්‍යයෙකු පැවිදි සිල්වත් උත්තමයන් වෙත ගොස් (මුලින් හඳුනා ගතයුතු) ස්වාමීනි, කුසල් අකුසල් මොනවාද? අපගේ මෙලොව පරලොව හිතසුව පිණිස කළ යුතු නොකළ යුතු දේ මොනවාදැයි නොවිමසා කටයුතු නොකර මරණින් මතු ඔහු දුගතිගාමී වෙයි. එසේ නොවී නැවත මිනිසත් ආත්ම භාවයන් ලදොත්, ඔහු මන්ද බුද්ධිකයෙක්ව උපදී.

13. එම අදහසින් බැහැරව යම්කිසි පින්වත් නුවණ ඇති මනුෂ්‍යයෙක් තමාගේ නුවණින් මොහු සැබෑ සිල්වතෙකි, පැවිදි උතුමෙකි, මොහු හොඳ ආදර්ශමත් දෙලොවටම වැඩදායක පාපයෙන් මිදුණු උතුමෙකි. මම මෙතුමාගෙන් අවවාද අනුශාසනා ලැබ මාගේ වැරදි අඩුපාඩු සාදා ගනිම්' යි සිතා එකී සිල්වත් උත්තමයන්ගේ අවවාද අනුශාසනා අනුව ජීවත් වෙමියි සිතා ක්‍රියා කළහොත් ඔහු මරණින් මතු සැප ඇති දිව්‍ය ලෝකය උපත ලබයි. එසේ නොමැතිව නැත මෙම මිනිස් ආත්ම භාවයෙහිම උපදී නම්, ඔහුගේ පෙර ආත්ම භාවයේ තිබුණු නුවණ තව තවත් දියුණු වී මහා ප්‍රඥාවන්තයකු බවට පත්ව ලෝකයාට පිහිට වේ.

පින්වත් මානවකය, මෙලෙසින් සියළුම සත්වයෝ තමන්ගේ කර්මය තමන් සතුකොට ඇත්තාහ. එසේම ස්වකීය කර්මයම දායාදකොට ඇත්තාහ. කර්මයම උපතට හේතුකොට ඇත්තාහ. කර්මයම ඥාතිකොට

ඇත්තාහ. කර්මයම පිළිසරණ කොට ඇත්තාහ. සත්වයා උසස් පහත් භාවයට පත්කරවන්නේ ස්වකීය කර්මය විසිනි. අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් මෙම සූත්‍ර දේශනාව මෙතකින් වදාළා නිමකරන ලදි. ඒ අසා සිටි තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවක තෙමෙ තුණුරුවන් සරණ ගොස් වැඳ නමස්කාර කොට නික්ම ගියේය.

පින්වත්නි,

ඉවතලන කුණුගොඩක් උපයෝගී කරගෙන එයට සාරවත් පස්. වතුර, අව්රශ්මිය එකතුකර රසවත් භෝගයක් හෝ පුෂ්පයක් සාදා ගන්නා වූ ආකාරයට මෙහි මුලින් සඳහන් බුදුසරණ පත්‍රය කාලයත් සමඟ යටපත් වී ගියේය. එහි වර්තමාන සමාජයට මැනව, යි සිතෙන ආදර්ශමත් සූත්‍ර දේශනාවක් කියවා බලා මෙය ධර්ම ග්‍රන්ථයක් ලෙස සම්පාදනය කිරීම මාගේ යුතුකමක් සේ සිතා බුද්ධ ධර්මය ප්‍රගුණ කරන්නාවුන් වෙනුවෙන් සංස්කරණය කරමි. මෙය මැනවින් කියවා බලා ධර්මාවබෝධයක් ලබත්වායි ප්‍රාර්ථනා කරමි.

ධර්මයේ සඳහන් වෙනවා අති භයානක දුක්දෙන නිරයන් අටක් සහ එම නිරයන්ට අයත් ශාඛා නිරයන් 128 ක් තිබෙන බව එපමණක් ද නොව තව තවත් එවන් කර්කෂ නිරයක් වූ ලොකාත්තරික නිරය ගැන එයට අමතරව තවත් නිරයන් හතරක් වන ප්‍රේත, අසුර, අපගේ ඇසට පෙනෙන තිරිසන් අපායක් ද තිබේ. සසර සැරිසන්නාවූ සත්වයා මේ ලියන මමත් කියවන ඔබත් ඇතුළුව මෙකී දුගති එකක් නෑර සෑම දුගතියකම අනන්ත අප්‍රමාණ කාල පරිච්ඡේදයන්හි විඳවා ඇත. ඉදිරියටත් මේවා අවබෝධ කරනොගෙන සිටියහොත් නැවත නැවතත් සසර දුකින් මිදීමක් නම් නැත්තේය. එම නිසා පහත සඳහන් නිරයන් ගැන සහ ඒවායේ උත්පත්තිය ගැනීමට වන හේතුකාරණා මෙය කියවා තේරුම් ගෙන දුගතියෙන් මිදී ස්වර්ගමොක්‍ෂ සම්පත් ලබා සසර දුකින් මිදීමට ක්‍රියාකරන මෙන් මෙයින් ඉල්ලා සිටිමි.

## දුශ්ශීලයන් උපදින නිරයන්

7. බුද්ධ ධර්මයට නිගා කළවුන්, පැසෙන සොගන්ධික නරකය.

73. අලජ්ජිව සිවුපසය පරිභොග කල මහණුන් පැසෙන අයගුල නරකය.

93. වෙදකම් කළ නැකත් කී මහණුන් පැසෙන සතග්ගි නරකය.

94. සංඝාදිසේසාදි ගරු ඇවැත්වලට පැමිණි භික්‍ෂූන් පැසෙන නුට්ඨුතග්ගි නරකය.

123. ප්‍රත්‍යවේක්‍ෂා නොකර ආහාර අනුභව කළ මහණුන් පැසෙන අපච්චවෙක්ඛිත නරකය.

124. ප්‍රතිපත්ති නුපුරා නිකරුණේ කල් යවන මහණුන් පැසෙන කුදුසග්ගි නරකය.

125. සඟසතු ගෙඩි, මල්, ගරුභාණ්ඩ ගිහියන්ට දුන් මහණුන් පැසෙන ලාබුපක්ඛ නරකය.

126. ඉන්ද්‍රිය සංවරය නොමැත්තවුන් පැසෙන ඉන්ද්‍රිය අබුත්ත නරකය.

127. අනිසිලෙස සංඝලාභ බෙදුවවුන් පැසෙන කුසග්ගි නරකය.

## සම්මාදන් එකතු කරන්නවුන් කනවුන් එයට අනුබල දෙන අනුග්‍රාහකයින්.

2. නොයෙකුත් මාතෘකා යටතේ සම්මාදන් එකතුකර කෑවවුන් පැසෙන උස්සද නරකය.

13. සම්මාදන් ගසා කැවවුන් පැසෙන ගූථ නරකය.

20. බුදුරජාණන් වහන්සේට පූජාකරන ලද බුද්ධ සන්තක දෙය කැවවුන් පැසෙන වෙතරණී නරකය.

84/85 අවසර නොමැතිව සඟ සතු දෙය අනුභව කළවුන් හා ගත්තවුන් පැසෙන අනුපට්ඨිතග්ගි නරකය. මෙම නිරයෙහිම සංඝයාට ගෙනා දෙයින් මුලින් අනුභව කළවුන්ද විඳවති.

86. සඟසතු ගරුභාණ්ඩවලින් ප්‍රයෝජන ගත්තවුන් පැසෙන කුම්භග්ගි නරකය.

98. සඟසතු තෙලින් ප්‍රයෝජන ගත්තවුන් පැසෙන තේලග්ග නරකය.

100. සඟසතු ඉඩම් භුක්ති වින්දවුන් පැසෙන විලසග්ගි නරකය.

118/119 ආරාමයෙහි පලා, පළතුරු, ගෙඩි වර්ග ගත්තවුන් පැසෙන පත්තග්ගි නරකය සහ ඵලමූලග්ගි නරකය.

## බුද්ධ, ධම්ම, සංඝ රත්නයට නොයෙකුත් ආකාරයෙන් අනාදර කළවුන් පැසෙන නිරයන්

08. සිල්වත් භික්ෂූන්ට හා ආර්‍ය්‍ය සංඝයාට නිගා කළවුන් පැසෙන උප්පල නිරය

20. බුදුරජාණන් වහන්සේට පූජාකරන දේ කැවවුන්ද කුලයෙන් ගටා අනුන්ට අපහාස කළවුන්ද පැසෙන වෙතරණී නරකය.

31. සිල්වත් මහණ බමුණන්ට හා දෙමාපියන්ට අනාදර කළවුන්ද විහාර දාගැබ් ආදියට (නිදන් හොරු) අනාදර කළවුන්ද විඳවන පොකුරුපත් නිරය.

55. බුදු - පසේබුදු - මහරහත් - මව්පියන්ට අපරාධ කළවුන් පැසෙන එකකල්ප නරකය (අවීචිමහ නිරය)

75. සිද්ධස්ථානවල හිස්වැසුම්, පාවහන් සහිතව ගමන් කලවුන් පැසෙන අන්ධාර පබ්බත නරකය.

76. මව්පියන් මහණුන් හික්මවීම සඳහා අනාදර කළවුන් පැසෙන මහංගුලොම නිරය.

77/78 අවිචාරමත් ලෙස චෛත්‍යය, ප්‍රතිමා, බෝධි උඩට නැගී අවමන් කළවුන් විඳවන උච්චාරුල්හ නරකය.

82. සිද්ධස්ථානවල මළ, මුත්‍ර, කෙළ, හොටු ආදිය දමා අපිරිසිදු කළවුන් පැසෙන මුත්තකරිසග්ගි නරකය.

83. සිද්ධස්ථානවලදී කාපු, බීපු තැන් පිරිසිදු නොකළවුන් පැසෙන දුස්මාලග්ග නරකය.

## වෙනත් හේතූන් මත නිරයගාමි වන්නවුන්

01. වායොවෘද්ධයන්ට අවමන් කළවුන්ද, දෙමාපිය මහණ බමුණන් බිම සිටියදී උස් ආසනවල සිටියවුන්ද වැදගත් අයට නින්දා අපහාස - කළවුන්ද පැසෙන අබ්බුද නරකය.

03. නොයෙකුත් ආකාරයේ සූදු ක්‍රියාවන්හි යෙදෙනවුන්ද ඒවා කළවුන්ද විඳවන අහග නිරහ.

22. අන්සතු ඉඩකඩම් බලෙන් වංචාවෙන් අයිතිකර ගත්තවුන් පැසෙන ගිජ්ක්ධකාක නරකය.

23. නිලබලයෙන් වෙනත් ආකාරයෙන් මිනිසුන්ට වධහිංසා කළවුන් පැසෙන සත්තිසුල නිරය.

26. ඊර්ෂ්‍යාදි , ක්‍රෝධාදිය බහුලකොට ඇති අයද අනුන්ගේ යස ඉසුරුවලට හානිකළවුන් ද මහණ බමුණන්ට දන් නොදුන්නවුන්ද විඳවන සිත නරකය.

27. මෙලොව නැත, පරලොව නැත, පිං, පව් නැත, මව නැත, පියා නැත ආදි මිථ්‍යා දෘෂ්ටි ගත්තවුන්ද ආයෝපවාද කළවුන්ද තෙරුවන් ගසා මව්පියන් ගසා බොරු දිවිරුම් දුන් අයද පැසෙන ලෝකාන්තරික නරකය.

29. මස්, මාළු කනවිට "බොහොම රසයි හොඳට තෙල් තියෙනවා" කිය කියා රස කර කර කෑවවුන්ද, දියගොඩ වසන මස්, මාළු කන සතුන් දැක සතුටු වුවන්ද විඳවන අඟුරුමැල නිරය.

30. කූට උපක්‍රම යොදමින්ද, සම්පප්‍රලාපබස් කියවමින්ද අනුන් රවට්ටා වෙළඳාම් කළවුන් විඳවන දලකෙස්මැලි නරකය.

32. පොහොය දිනවල වැඩකල අය ඔසප් බව නොහඟවා විසුවන් පැසෙන පොකුරුපත් නිරය.

33. නොයෙකුත් ආකාරයෙන් ජිවිත හානි කරගත්තවුන් ද, වධහිංසා පමුණුවමින් සතුන්ගෙන් වැඩ ගත්තවුන්ද පැසෙන රෝරුහ නරකය.

46. කාමුක හැඟිමෙන් යුතුව ස්ත්‍රී, පුරුෂයන් ඔවුනොවුන් අසභ්‍ය ලෙස විහිළු, තහළු කළ අයද, බුදුසරණ ගෙන කට්ටඩිකම් කළවුන්ද මේ කාලයේ බුදුරජාණන් වහන්සේට වඩා දෙවියන්ට බලය තිබේ යැයි සිතන, කියන අයද, දේවාල කපුවන්ද විඳවන මංගුලිත්ථක නිරය.

49. පරලාභ වැළැක්කවුන් පැසෙන පරලාභ නිරය

87. නුසුදුසු ස්ථානවල මලපැහැරුවුන් පැසෙන ගුදග්ගි නරකය.

101. අනුන්ගේ කිම් බස් අසා අයුතු අසාධාරණකම් කළවුන් පැසෙන දිට්ඨානුගති නිරය.

105. අංගවිකල, මන්ද බුද්ධික, විරූපින්ට උසුළු, විසුළු කළවුන් පැසෙන පධනදායග්ගි නිරය.

107. විසකුරු සතුන්ගෙන් සහ වෙනත් ආකාරයෙන් අනුන් බිය ගැන්වූ අය විඳවන සප්පමුසලග්ගි නරකය.

109. පොරොන්දු කඩකළවුන් පැසෙන සුමනතාප නරකය.

115. බුදුරජාණන් වහන්සේට නොපුදා ආහාර අනුභව කළවුන් පැසෙන පුටග්ගි නිරය

117. බලු, බළල්, එළු, කුකුළු, ගව ආදී සතුන් පොර කෙටවූවන් පැසෙන කුක්කුටග්ගි නිරය

121. අධික ලෝභ මසුරයින් පැසෙන ඔසක්කතාපි නරකය.

13. අන්සතු දෙය බලෙන් ගත්තවුන්ද, කෑ බතට මෙහෙ නොකළවුන්ද, ගත් ණය නොදුන් අය සහ මිත්‍ර ද්‍රෝහීන් සහ පරලාභ වැලැක්වුන් පැසෙන ගුථ නරකය.

### ස්ත්‍රීන් වෙනුවෙන් වෙන්වූ නිරයන්

15. පර ස්ත්‍රී පුරුෂ සේවනය කළවුන් පැසෙන සිම්බලනිවනය හෙවත් කොළ හිඹුල්වනය නිරය.

32. ඔසප් බව නොහඟවා විසුවන් පැසෙන පොකුරුපත් නිරය

36. ඔසප් බව නොකියා ආහාර සපයා දුන් අය පැසෙන මාසපෙසි නිරය

45. ගර්භපාතනය කළවුන්ද පැවිද්දන්ට පීඩා කළවුන්ද පැසෙන මුල්භගබිබ නිරය

46. කාමුක හැඟීමෙන් යුතුව ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන් අසභ්‍ය ලෙස කවටකම් කළ අය විඳවන මංගුලිත්ථක නරකය.

47. සම්පප්‍රලාප දෙඩුවන්ද සපත්නිරොෂයෙන් ක්‍රියාකරන ස්ත්‍රීන්ද විඳවන ඔතලි නරකය.

106. තම ස්වාමියාට නොසලකන වධක භාර්යාදීන් පැසෙන උදකද්වාරි නරකය.

### ප්‍රාණඝාත අකුසල කළවුන් විඳවන නරකයන්

02. මස්, අවි, ආයුධ, වස, විස වර්ග අධර්ම වෙළඳාමෙන් ජීවත් වූවන් විඳවන නිරබ්බුද නරකය.

05. ප්‍රාණඝාත කළවුන් සහ මිසදිටුවන් පැසෙන අවීචි නිරය

14. උණුදිය - තෙල් - ගින්දර ආදියෙන් සතුන් මැරූ අය ගෙවල් පිළිස්සුවන්ද පැසෙන කුක්කුල නිරය

16. මස්, බිත්තර පිණිස සතුන් ඇතිකරපු අයද, හරකුන්, එළුවන්, කුකුළන්, ඌරන් ආදි සතුන් මැරුවවුවන්ද, මස් විකුණු අයද විඳවන අසිපත්තවන නරකය.

19. සතුන්ට හිංසා පීඩා කළවුන් (හන ගැසීම් - නාස්ලණු දැමීම්) පැසෙන තිප්පාකටුක නිරය.

21. කෙමන්, උගුල්, මළපුඩු, දැල් දමා සතුන් මැරූ අය විඳවන සොනබාදක නිරය.

40. විශේෂයෙන් දඩයම්කරුවන් විඳවන සත්තිලෝම නිරය

53. සතුන්ට බලවත් ලෙස පීඩාකරන්නවුන් පැසෙන සඤ්ජීවච නරකය.

**හොරකම් කරපු අයට තිබෙන නිරයන්.**

03. නොයෙකුත් ආකාරයේ සූදු කෙළියෙහි යෙදෙනවුන් සහ සම්මාදම් එකතුකරගෙන කෑවවුන් වැටෙන අහහ නිරය

04. හොරකම් කළවුන් සහ අහිංසකයින්ට පීඩාකළවුන් උපදින අබ්බට නරකය.

නොයෙකුත් ආකාරයේ මහජන පහසුකම් සඳහා යයි ද ආධාර උපකාර සඳහා යයිද ආධාර සම්මාදම් එකතුකර කෑවවුම් විඳවන උස්සද නරකය.

30. තුලාකූට - මානකූට - කංසකූට (කිරුම් - මිනුම් - ලංසු තැබීම්) ආදී කපටි හොර වෙළදාම් ක්‍රමවලින් ජීවත්වූවන් විඳවන දළකෙස්මැලි නිරය

## කාමයෙහි වරදවා හැසිරුනවුන් විඳවන නරකයන්.

43. ස්ත්‍රී දූෂණය කළවුන් හා සම්මාදම් ගෙන කැවවුන් පැසෙන ගූථබාදක නිරය

45. ගබ්සා කළවුන් පැසෙන මුල්හබ්බ නිරය

74. භික්ෂුණී දූෂකයන් විඳවන අවවන්තර නරකය.

89. ස්ත්‍රී ධූර්තයන් පැසෙන විපරීතග්ගි නරකය.

## මුසාවාදා වේරමණී

27. දෙවියන්, දෙමාපියන්, තුණුරුවන් සහ වෙනත් දේ කියමින් බොරුවට දිව්රපු අය දුක්කර්ම විපාක ගෙවන ලෝකාන්තරික නිරය. මෙම නිරය අටමහ නරකයන්ට අයත් 128 නිරයන්ට අයත් නැත. වවුලන් ගස්, ගල්, පර්වත ආදියෙහි එල්ලී සිටින්නාක් මෙන් විශාල ගල්පර්වත වල එල්ලී සිටිමින් ලොව්තුරා බුදුබවට පත්වන ආත්ම භාවයෙහි මව්කුස පිළිසිඳ ගන්නා උත්තමයෙකු ලෝ පහළ වුවොත් පමණක් ඔවුන්ට ආලෝකයක් ලැබේ.

ලෝකාන්තරික නිරය යනු මෙම පෘථිවියෙහි තිබෙන නිරයන් නොව අපගේ සූර්යයාගේ සිට බොහෝ ඈතින් පිහිටා තිබෙන මෙ පෘථිවිය වන් ලෝක ධාතුවකි. එසේම තවත් මෙවන් සක්වල දෙකක් අතර පිහිටීමක් අපගේ සූර්ය රාජයාගේ මෙන් එම සක්වල දෙකට අයත් සූර්යාලෝකයක් නොලැබීමත් නිසා මෙයට ලෝකාන්තරික නරකයයි කියනු ලැබේ. එහි තිබෙන අන්ධකාරය අපට මධ්‍යම රාත්‍රියකදී තිබෙන අන්ධකාරයට උපමා නොකළ යුතු. ඒ මන්ද යත් :- අපට රාත්‍රිය ලැබෙන්නේ අපගේ පෘථිවියෙන් අඩකින් සූර්යයා

ආවරණය වන නිසයි. එසේ එක් කොටසකට අඳුර වුවත් නිරන්තරයෙන් දිවා රෑ ලැබීමත් අඳුරු පෙදෙසේ අහස පුරා ඉර එළිය තිබීම නිසා අපට තිබෙන්නේ අඩ අඳුරකි. තාවකාලික අඳුරකි. ලෝකාන්තරික නිරයට සැගවෙමින් ආලෝකයක් හෝ නොමැති නිසා තද ඝන අන්ධකාරයම නිරන්තරයෙන් පවතී.

ඉහත සඳහන් කළ ආකාරයෙන් මෙම නිරයෙ උපදින්නේ ඉර, හඳ, පෘථිවිය, මව, පියා, බුද්ධ, ධම්ම, සංඝ සහ පව පින නොහඳුන මිථ්‍යා දෘෂ්ටිය වීම නිසයි. ඒ නිසා යමක් තමාගේ සිතට එකඟ නොවී පිලිගැනීමට නොහැකිනම් එය කෙලින්ම ප්‍රතික්ෂේප කරනවාට සහ අපහාස කරනවාට මට මෙය අවබෝධ කරගැනීමට නොහැකි වුවත් මෙතරම් ගැඹුරු ගාම්භීර ධර්මයක් දේශනාකර තිබෙන්නේ බුදුරජාණන් වහන්සේම නිසා මෙහි යම් අර්ථයක් ඇතැයි සිතා හෝ පව් රැස්කර ගැනීමෙන් වලකින්න.

28. කේලාම් කියා උණුනුන් භේද කළවුන් පැසෙන තිරකර නරකය.

44. කේලාම් කීවවුන් සහ උල් - කටු ආදියෙන් අනුන්ට පීඩා කළවුන් විඳවන සුචක නරකය.

56. ගුණවතුන්ට - සිල්වතුන්ට - පැවිදි උතුමන්ට නින්දා අපහාස කළවුන් පැසෙන ද්විකල්ප නරකය (මහා කල්ප දෙකක්)

96. බොරු කියන්නවුන් පැසෙන විරහිතග්ගි නරකය.

97. පරුෂ වචනයෙන් අනුන්ට අපහාස කළවුන් පැසෙන පරුසග්ගි නරකය.

104. කෙළි සිනා පිණිස බොරුකීවවුන්ද මහණ, බමුණන් සමඟ සරදම් කළාවුන් පැසෙන හාස්සාධිප්පාය නරකය.

## සුරාමේරයට ඇතුලත් අය

02. මත්පැන්, මත්කුඩු වෙනත් මත්ද්‍රව්‍ය භාවිතා කළවුවන් පැසෙන නිරබ්බුද නරකය.

18. මත්පැන් වෙනත් මත්ද්‍රව්‍ය භාවිතා කළවුන් පැසෙන ලොහොකුඹු නිරය

90. සුරාධූතයින් පැසෙන පසුතග්ගි නරකය.

මෙතෙකින් එකසිය විසිඅටක් කොටස් දහයකට වෙන්කර දැක්වූයේ, සමාජයේ විවිධ කොටස් විසින් කරගන්නාවූ අකුසලයන් හඳුනාගෙන ඒ ඒ අය මරණින් මතු ලබාගන්නා වූ සැපෙන් තොර දුකින් පිරුණු නිරයන් දැන ගැනීමටත් මෙකී නිරයන්ට බුදුරජාණන් වහන්සේ විසින් මොන අර්ථයක් ඇතිව මෙකී නාමයන් යෙදුවුවා යැයි නොදනිමි. එම නාමයන්ගේ විශේෂ අර්ථයක් ඇතිනිසා එවන් නාමයන් යොදන්න ඇත. කෙසේ නමුත් පව පින හඳුනාගෙන දුගතිකාමී වීමට තිබෙන අවස්ථාවන්ට පත්නොවී, මිනිසත් ආත්මභාවයක් ලබා උතුම්ම සැපත වූ සියළුම දුක්ඛයන්ගෙන් මිදී නිවන් පිණිසම ප්‍රාර්ථනා ඇතිකරගෙන නුවණ ලැබෙන පින්දහම් වලම යෙදෙන්න.

මෙතෙක් පෙන්වා දුන්නේ ප්‍රධාන නරකයන් අටට අයත් ශාඛා නිරයන් එකසිය විසිඅට සහ ලෝකාන්තරික නිරය ගැන කෙටි විස්තරයෙකි. දැන් අපි මහ නරකයන් 8 ගැනත් අනෙක් අපායන් තුන ගැනත් විස්තර දැනගනිමු.

1. නරකාදිය
2. ප්‍රේත අපාය
3. තිරිසන් අපාය
4. අසුරකාය භූමිය

අපාය නොහොත් නිරය යනු ඇසිපිය ගසන තරම්වත් වෙලාවක් නිවීමක් සැනසීමක් නැති මහත් දුක්පීඩා ගෙනදෙන අභාග්‍ය ස්ථානයකි. කුසල් අකුසල් හඳුනා නොගෙන සත්වයා මෙලොව ජීවත්වන කාලය තුළ කරගන්නා වූ පාප කර්මයන් හේතු කොට ගෙන එම පාප කර්මයන්ගේ තරාතිරම් අනුව උපදින නිරයන්හි කෙටි විස්තරයක් පහත සඳහන් කරමි.

## සංජීව නරකය

ප්‍රාණඝාතය කළාවූ සත්වයන් උපදින නිරයකි. පොළොව මතුපිට සිට යොදුන් 15000 පහළොස් දහසක් යටින් තිබෙන අටමහ නිරයන් ගෙන් පළමුවන නිරයයි. යොදුන් පහළොස් දහසක් යනු පෘථිවිය මතුපිට සිට සැතපුම් 24000 විසිහතර දහසකි. නවීන විද්‍යාවෙන් කියා නොයෙකුත් බොරු රැවටිලි ඡායාරූප සහ වෙනත් දේ කියමින් පෙන්වමින් මනුෂ්‍යයා මුලාකරවන්නේ මොනම විද්‍යා උපකරණයක් හෝ පෘථිවිය යට සැතපුම් හාරදහසක් වත් යවන්න පුළුවන්ද. සැතපුම් 24000 කියවුයේ යොදුනකට සැතපුම් දහසය ගණනේ ගණන් එකතු කරගෙනයි. බොහෝ බණ පොත් වල තිබෙන්නේ යොදුනකට සැතපුම් 25 ක් කියායි. එසේ නම් තවත් යටට මෙකී නිරය පිහිටිය යුතුයි. එහි ආයුෂ කාලය සහ තිබෙන වෙනත් විස්තර අනුව ඒසා දුරකින් පිහිටා ඇති බව බුද්ධිමතුන්ට අවබෝධ කරගත හැක. එහි උපදින්නාවූ නිරිසතුන්ගේ වයස නිරය ගණනින් අවුරුදු පන්සියයකි. (500) එහි එක්දවසක් මිනිස් ලොව ආයු පමණින් අවුරුදු නව ලක්ෂයකි. එයාකාරයට යටින් පිහිටි අනෙක් නිරයන් හතටත් දින, සති, මාස, අවුරුදු වශයෙන් ගණන් සාදා බලන්න.

## 2. කාල සූත්‍රය

මව්පිය, ගුරුවර, උපාද්ධ්‍යාදීන් කෙරෙහි වරදවා පිළිපදින සත්වයෝද, මිත්‍යාදෘෂ්ටි ගත්තාවූ සත්වයෝද, වැඩිවශයෙන් කාලසූත්‍ර

නරකයෙහි උපදින්නාහුය. මෙම නිරය සංජීව නිරයට යොදුන් 15000 ක් යටින් පිහිටා ඇත. එහි ආයුෂ නිරය ප්‍රමාණයෙන් අවුරුදු දහසකි. එහි එක් දවසක් සංජීව නරකයට දවස් හතරකි.

### 3. සංඝාතය

ගවයන් - එළුවන් - ඌරන් - කුකුළන් ආදි වූ නොයෙකුත් සත්වයන්ද ජලජ ප්‍රාණීන්ද ඇතිකර ඝාතනය කොට ජීවත් වන්නා වූ වැදි - කොවුන් ආදි නොයෙක් ව්‍යාපාරිකයන් උපදින නිරයක්. කාල සූත්‍ර නිරයට යටින් යොදුන් 15000 ක් යටින් පිහිටි මෙම නිරයෙහි ආයුෂය අවුරුදු දෙදහසකි. එක් දවසක් කාල සූත්‍ර නිරයෙහි හතරකි.

### 4. රෞරවය

සංඝාත නිරයට යොදුන් 15000 යටින් පිහිටා ඇති මෙම නිරය, සතුන්ට හිංසා පීඩා කරන්නාවූද, ඉන්ද්‍රජාල මායාකාර ආදි අනුන් රවට්ටා ජීවත්වන්නාවූද, සත්වයන් වැඩි වශයෙන් උපදින නිරයකි. එහි ආයුෂ නිරය ගණනින් අවුරුදු හාරදහසකි. සංඝාත නරකයෙහි දින හතරක් මෙම නිරයට එක් දිනයකි.

### 5. මහා රෞරවය

තුණුරුවන් සතු වස්තු පැහැරගන්නාවූද, අම්බලන් (මගී ආවරණ) , මාර්ග පාලම්, ඒ දඬු, මගී විශ්‍රාම ශාලාවන් ආදිය විනාශ කරන්නාවූද පුද්ගලයන් උපදින නිරයකි. රෞරවයට යොදුන් 15000 ක් යටින් පිහිටි මෙම නිරයෙහි වසන නිරිසතුන්ගේ ආයුෂ නිරය ගණනින් අවුරුදු අටදහසකි. එහි එක්දිනක් රෞරවයට දින හතරකි.

## 6. තාපය

ආහාරය පිණිස, තෑගි දීම පිණිස, දන්දීම පිණිස, සතුන් මැරුවාට පවක් නැත. නරක් වෙනවාට ප්‍රාණය දී තිබෙන ගෝවා ගෙඩිය, මනුෂ්‍යයාගේ අවශ්‍යතාවයට සිටින සතුන් මරා කෑවාට පවක් නැත. අනිෂ්ට විපාකයක් නැත. අපායත් දෙව්ලොවත් දෙකක් තිබෙන්නේ මෙම මනුෂ්‍ය ලෝකයේම මිස වෙනත් තැනක පිහිටා නැත යානාදි වශයෙන් මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූ පුද්ගලයන් උපදින අපායකි. මහා රෞරවයට යොදුන් 15000 ක් යටින් පිහිටා තිබෙන මෙම නිරයෙහි ආයුෂ නිරය ගණනින් අවුරුදු දහසය දහසකි. එහි එක් දිනක් මහා රෞරවයට දින 4 කි.

## 7. මහාතාපය (ප්‍රතාපය)

හෙවත් ප්‍රතාපය බුදුන් කියා කෙනෙක් නැ. දහමක් කියා දෙයක් නැත. ආර්ය සංඝයා කියා වෙනම කොටසක් නැත. යනාදි බලවත් මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූ පුද්ගලයන් උපදින භූමියක්. මෙම නිරයද තාප නිරයට යටින් යොදුන් 15000 ක් ඈතින් පිහිටා තිබේ. එහි ආයුෂ අන්තර කල්පයකි. එය එක් කල්පයකදී පහළවන බුදුරජාණන් වහන්සේලා දෙනමක් අතර තිබෙන පරතරයකි. තවත් උපමාවක් වශයෙන් කියනවානම් අප ජීවත්වන මෙම පෘථිවිය ගසක, වැලක හටගන්නාවූ ගෙඩියක් ක්‍රම ක්‍රමයෙන් ලොකුවෙන ආකාරයට මෙම පෘථිවියද අවුරුදු දහසකට අඟලකින් වර්ධනය වන්නේය. එසේ වර්ධනය වන මෙම පොළොව ගව් හතක් නොහොත් සැතපුම් 28 ක් වර්ධනය වන කාල වකවානුවයි.

## 8. අවීචිය

මව, පියා - රහතන් වහන්සේ මැරුවා වුද, බුදුරජාණන් වහන්සේ නමකගේ ශරීරයේ ලේ සෙලවීම කළාවුද, සංඝ භේදය කළාවුද, සඟසතු දේපල, ආරාම, දාගැබ්, බෝමලු, ප්‍රතිමා, රූපාදිය විනාශ

කළාවුද සත්වයන්ගේ උත්පත්ති භූමියකි. ප්‍රතාපය නරකාදියට යටින් යොදුන් 15000 ක් පසුකළ පසු පිහිටා තිබෙන අවසාන නිරයයි. එහි ආයුෂ මහා කල්පයකි. එහි උපදින සතුන්ට ඇසිපිය ගහන පමණ වේලාවකුදු නොමැතිව අති භයානකම දුක් දෙන්නේය. තවද මෙම නිරයෙහි ආයුෂ උපමාවකින් පෙන්වා දෙනවානම් ඉහත කී 7 වන නිරයෙහි ආයුෂ විසි ගුණයකින් වැඩි කිරීමකි. එනම් මහ කල්පයක ආයුෂ අතුරු කල්ප විස්සකි. දෙව්දත් තෙරුන් වහන්සේ මෙම නිරයෙහි මෙම කල්පය අවසන් වනතුරුම ඉහත කී ආකාරයට මෙසේ බලවත් දුක් විඳින්නේය. එනම් :- ශරීරයේ උස යොදුන් සියයකි. යටි පතුලේ සිට දෙදණ දක්වා යොදුන් විසිපහකි. එතෙක් උස ප්‍රමාණයට ගිනි අඟුරුවලින් වැසී තිබේ. හිසේ ප්‍රමාණය යොදුන් පහකි. නිරන්තරයෙන් වර්තමානයේ තිබෙන මිසයිලක හැඩයට සමාන ගිනියම් වූ ලෝහ කඳක් හිස මුදුන පලාගෙන අවුත් ශරීරය අභ්‍යන්තර පුළුස්සමින් අධෝමාර්ගයෙන් පිටවෙති.

පාපකර්මයේ බලයෙන් මැරෙන්නේ නැත. එම පිළිස්සුණු තුවාලය නැවත නැවත වැඩෙන තෙක් පපු ප්‍රදේශයේ තවත එවන්ම ගිනියම් වූ ලෝහ කඳක් ඇතුළු වී පිට ප්‍රදේශයෙන් පිටවී යයි. ඉන්පසු නැවත එවන් අග්නි ජාලාවක් සහිත ලෝහ ඊ පහරක් අධෝමාර්ගයෙන් ඇතුළු වී හිස මුදුනින් පිටවී යයි. ඉන්පසු තවත් එවන්ම හී පහරක් පිට ප්‍රදේශයෙන් ඇතුළු වී පපු ප්‍රදේශයෙන් පිටවී යයි. එයට අමතරව මුළු ශරීරයටම කිසිවෙකුගේ මෙහෙයවීමක් නොමැතිව ස්වභාවිකවම නිරන්තරයෙන් යොදුන් සිය ගණන් ඈතට විහිදෙන අග්නි ජාලාවෙන් පිළිස්සෙන්නේය.

පැනෙන් දෙව්දත් තෙරුන් වහන්සේ විඳිනාවූ දුක් කන්දරාව මෙසේ පෙන්වූවත් කෙසේ සිතන්නද? එම වද වේදනාවලින් මිදෙන්නේ මා විසින් ඉහත සඳහන් කරන ලද අතුල් කල්පයක පරතරය තේරුම් ගෙන මෙම කල්පය විනාශවීමට තවත් එවන් අතුරුකල්ප 15 කටවත් මදක් වැඩියෙන් ඉතිරිව තිබේ. මේ වනවිට මේ කල්පයෙන් ගෙවී ගොස් තිබෙන්නේ අතුරුකල්ප 4 පමණයි. මේ සා දීර්ඝකාලයක් එවන්

දුකක් විඳවන්නට කුමන හේතුවක් වීද? යත් :- බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙන් ලේ සෙලවීම සහ සංඝ භේදය යන බරපතලම අපරාද දෙක එයට හේතුව වෙයි. මේ ගැන දීර්ඝ ලෙස විස්තර දැනගැනිමට මිලින්ද ප්‍රශ්නය පොත් වහන්සේ කියවා තේරුම් ගන්න එහි ඇතුලත් එක් කාරණයක් පමණක් මෙහි ඇතුලත් කරමි.

එදා මිලිඳු රජතුමා නාගසේන මහරහතන් වහන්සේගෙන් ප්‍රශ්නකර සිටිනවා "පින්වත්, නාසේනයන් වහන්ස, බුදුරජාණන් වහන්සේ සියලු සත්වයා කෙරෙහි පතල මහා කරුණාව තිබේ නම්, තුන්කල්හිම දකිත්නම්, දනිනම්, දෙව්දත් තෙරුන් වහන්සේ ඒසා බලවත් පාපකර්මයක් වූ සංඝභේදය කිරීමට ඔහුට පිහිට වුයේ බුදුරජාණන් වහන්සේ විසින් පැවිදි භාවය නොදුන්නා නම් මේ සා දීර්ඝ කාලයක් ඒසා මහත් දුක්කන්දරාවක් විඳවන්නට වෙන්නේ නැ නේද? ඒ අනුව මට බුදුරජාණන් වහන්සේ තුන්කල්හි දනි දකී කියන කියමනක්. සියලු සත්වයාට පතල මහා කරුණාව තිබෙන බව හෝ පිළිගැනීමට අසීරු නිසා එය පහදා දෙන සේක්වා !" යි ඉල්ලා සිටියේය.

එවිට නාගසේන මහරහතන් වහන්සේ "මහරජතුමනි, බුදුරජාණන් වහන්සේ සකල සත්වයා වෙත පතල මහා කරුණාවෙන් යුක්තයි. ලේ ජාතක රාහුල පුතණුවන්ට ආත්මයෙන් ආත්මයට කල්පයෙන් කල්පයට සේරිවානිජ ජාතකයේ සිට වෛරීව ආවා වු දෙව්දත් තෙරුන්ටත් එම කරුණාවේ මෛත්‍රියේ අඩු වැඩියක් නැත. දෙව්දත් කුමරුවන් පැවිදිභාවය පතා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි වේලේම ඔහු කව්ද කියාත් ඔහුගෙන් තමන් වහන්සේට මෙ බුද්ධ ශාසනයටත් වන කරදර පීඩාදිය දැන දැනත් මෙසේ සිතු සේක."

"මේ අවාසනාවන්ත පාපි පුද්ගලයාට මාගෙන් හැර අන් කවරෙක්ගේ පිහිටක්ද, බුදුරජාණන් වහන්සේලා දහසක් නමක් ලෝ පහළ වුවත් මේ පුද්ගලයාට පිළිසරණක් නම් නැත්තේමය. මේ දරුණු පාපි පුද්ගලයා කල්ප අසංඛ්‍යයකටවත් සතර අපා අටමහ නිරයන්ගෙන් මිදීමක් නම්

නැති නිසා මම මොහුට පිහිට වෙමි." යි සිතා පැවිද්ද දුන්සේක. එසේ දීමෙන් මෙම කල්පය අවසන් වනතුරු අවීචි මහ නිරයෙහි එම පව ගෙවා මහ පොළොව විවෘතව නිරයගාමී වන අවස්ථාවේදී

"ඉමෙහි අට්ඨිහිතමගගපුගගලං
දෙවාතිදෙවං නරදමම සාරථිං
සමනතචකඛුං සතපුඤ්ඤ ලකඛණං
පණෙහි බුධං සරණං උපෙමි"

යන මේ ගාථාවෙන් සනරාමරලොකාග්‍ර පුද්ගල වූ දෙවාති දෙව වූ, දමනය කළ යුතු වූ මනුෂ්‍යයන් තදංගවිනයාදියෙ හි හික්මවා දමනය කරන්නා වූ, සියල්ල දක්නා සමන්ත චක්ඛු නම් සර්වඥතා ඥානයක් ඇත්තා වූ, ශත පුණ්‍ය ලක්ෂණයෙන් යුක්ත වූ ඒ බුදුරජාණන් වහන්සේ දිවිහිමියෙන් සරණට පැමිණෙමි. "එහෙයින් ස්වාමීනි, මාගේ ලොව්තුරා බුදුරජාණෙනි, ඔබ වහන්සේට අපරාධ කළ මා කෙරෙහිද, ඔබ වහන්සේගේ අත ඇඟිලි කපා මරන්නට පැමිණියා වූ අංගුලිමාල නම් මිනිමරුවා කෙරෙහිද එකාකාරව කරුණාව මෛත්‍රිය දැක්වූ සේක. ලොව්තුරා බුදුවූ ඔබ වහන්සේට  වීමි. අප සුද්ධෝදන මහරජාණන්ට බෑන වීමි. මා නැගනියන් යශෝධරාවන්ට වැඩි සිටියෙමි. රාහුල කුමරුට මයිලනු වීමි. ස්වාමීනි, මේ කාරණය කරණකොට ගෙන මා දුගතියෙන් මුදවා ගෙන වදාළ මැනව" යි කියා කියා පොළෝ ගිලෙමින් දිවි කෙළවර කොට බුදුන් සරණ ගියේය.

එම සරණ ශිලයෙ බලයෙන් යම් දවසක අවීචි මහ නිරයෙන් මිදී මතු සටඨිස්සර නමින් පසේ බුදු බවට පත්ව නිවන් දක්නා සේක. තවදුරටත් වර්තමානයේ ජිවත්වන අයගේ බුද්ධියමද නිසා තවත් විචිකිච්චාවක් ඇතිනොවීම සඳහා කකුලක ඇනුනු බුද්ධියමද නිසා තවත් විචිකිච්චාවක් ඇතිනොවීම සඳහා කකුලක ඇනුන කටුවක් ඉවත් කිරිම පිණිස තවත් කටුවකින් ඇනීමෙන්ද එයත් ප්‍රමාණවත් නොවේ නම් තියුණු කැපෙන පිහිටයකින් කටුව ඇනුණ පෙදෙස කපා

එම කටුව ඉවත් කරන්නේත්, දොස්තර මහත්වරු ශල්‍යකර්ම කරන්නේත්, වෛරය කින් පළිගැනීමකින් නොව ලෙඩා සුවකිරීම පිණිසය කියා වදාළ සේක. සසර කල්ප අසංඛ්‍ය ගණන් අටමහ නිරයන්හි දුක්විඳින පුද්ගලයෙක් එක්කල්පයක් පමණක් දුක්විදීම එම උපමාවලට සමානයි.

තවද පිතෘ ඝාතනය කළ අජාසත් රජතුමාත් අවීචි මහ නරකයටම අයත් ශාඛා නිරයක් වූ පදුව නම් නිරයෙහි අවුරුදු 30000ක් (තිස්දාහක්) මහත් දුක් විඳවා එයින් මිදී අවුත් දෙව්දත් තෙරුන් සේම පසේ බුදු බවට පත්ව පිරිනිවන් පා වදාරන්නේය. ඒ අවුරුදු තිස්දහස මනුලොව වර්ෂ වශයෙන් නිරයෙහි ආයුෂ අනුව බලතොත් විනාඩි ගණනකි. අජාසත් රජතුමා පිතෘ ඝාතනය නොකලා නම් ඒ ආත්ම භාවයෙහිම බුදුරජාණන් වහන්සේගෙන් බණ ඇසූ වේලේම සෝවාන් ඵලයට පත්වීමට කුසල් බලය තිබුණි. නමුත් බණපොතේ මෙසේ සඳහන් වෙනවා. පඤ්චානන්තරි පාපකර්ම කරපු කිසිම සත්වයෙක් ජීවමාන බුදුරජාණන් වහන්සේ නමකගේ සිවුරේ එල්ලී සිටියත් අපාගත වීම වැළැක්විය නොහැකි බව.

පඤ්චානන්තරි පාප කර්මයටත් වඩා දරුණු පාප කර්මයකි නියත මිථ්‍යා දෘෂ්ටිය ගැනීම. එම නිසා මෙහි සඳහන් යම් යම් නිරයන් ගැන හෝ වෙනයමක් ගැන හෝ තමාට අවබෝධයක් ගැනීමට නොහැකි නම් ඒ ගැන විචිකිච්ඡාවක් ඇතිකර නොගත යුතු.

## ප්‍රේත අපාය

සැපයෙන් තොරවූ දුකටම සා - පිපාසාදිය සෙවීම පිණිස වර්ෂ සිය - දහස් - ලක්ෂ - කෝටි - ප්‍රකෝටි අතුරු කල්ප මහා කල්ප ගණන් ගෙවුනත් උගුරු තෙමන තරමට වතුර පොදක්වත් නොලැබුණත් කර්ම බලවේගයේ මහිමයෙන් පාප කර්ම ගෙවන තුරු මැරෙන්නේද නැත. මෙහි වැඩි විස්තර දැනගැනීම සඳහා "ප්‍රේත වස්තු" බණ පොත් කියවන්න. අප මේ ගෙවන ජීවිත හොඳයි සැපයි කියා සිතුවාට

නිරන්තරයෙන්ම බොහෝ දුකසේ ලබා ගන්නාවූ මිනිසත්භාවය සතර අපායටම ගොදුරු වෙමින් පවතී.

## තිරිසන් අපාය

මනුෂ්‍යයන් මෙන් කෙලින් යාමට නොහැකි හරස්ව නැමී යන්නේ තිරචජානයෝයි. ඔවුන්ගේ ජාතිය තිරිසන් යෝනියයි. මේ තිරිසනුන්ට තැන් නියමයක් නැත මාර්ග ඵලයන්ගෙන් මිදුනාවූද, යට භාගයට යන්නා වූද යන අර්ථයෙන් ද එකී නාමය ලැබෙන්නේය.

## අසුර භූමිය

අසුරයෝ කොටස් පහකි. එනම් :- දෙව අසුර, විනාපාතික අසුර, වේමානික අසුර, ලොකාන්තරික අසුර සහ ප්‍රේත අසුරයෝය. මෙයින් ප්‍රේත අසුරයෝ පමණක් සතර අපායට ඇතුලත් වේ. සම්පත්තියෙන් දෙවියන් හා සමාන වූ වෙපචිත්ති, පහාරාදි අසුරයො දෙව අසුරයො දුහේතුක කාමාවචර මහා විපාක සිතකින් පටිසන්ධිය ලැබූ නමුත් ප්‍රවෘත්ති කාලයේදිය. ත්‍රිහේතුක මහා විපාක ලබන්නාවූ දෙවියන්ට බඳු පස්කම් සැප අනුභව කරන හෙයින් තව්තිසා දෙවියන් කෙරෙහි ඇතුලත් වෙති. එනමුත් ඔවුන්ට ත්‍රිහේතුක පටිසන්ධිය ලැබූ දෙවියන්ට මෙන් ධ්‍යාන මාර්ගඵලාදිය නොලැබේ.

පියංකර මාතු, උත්තරමාතු ආදි හු විනිපාතික අසුරයෝය. යම රජු වේමානික අසුර කොටසට අයත්ය. ලොකාන්තරක නිරයෙහි වසන අසුරයො එනමින්ම හැඳින්වේ. ප්‍රේත අසුරයෝ නම් කාලකඤ්ජික ප්‍රේතයෝමය. මේ අසුරයෝද අපායට ඇතුලත් වෙති. ලොකාන්තරික අසුරයන්ද නිරයටම අයත්ය. මෙයින් විනිපාතික සහ වේමාතික අසුරයන් චාතුර්මහාරාජික දෙව්ලොවට අයත්ය. මෙම අපායන් හතර අතුරෙන් තිරිසන් ප්‍රේත සහ අසුරයින්ට නියම භූමි නැත. ඔවුන්ගේ ස්කන්ධයෝම ඔවුන් ට භූමි වෙත්. එබැවින් මෙම තිරිසන්, ප්‍රේත සහ අසුරයෝ

වාසය කරන්නාවූ ස්ථාන කෙසේ වෙතත් ඔවුන්ගේ පඤ්චස්කන්ධයෝම තිරිසන් භූමි ප්‍රේත භූමි සහ අසුර භූමි යයි සලකනු ලැබේ. අපාය පටිසන්ධිය. ලැබූ මෙම තිරිසන් ආදී සතුන් රජ මාලිගය ආදියෙහි හෝ වෘක්ෂ, වන, පර්වත, ගංගා මහා සමුද්‍රාදීන්හි හෝ කුණු කසල අසූචියෙහි හෝ වෙසෙතත්, එකම අහේතුක අකුසල විපාක ප්‍රතිසන්ධියකින්ම පිළිසිඳගත් සත්වයෝමය.

සතර අපාය භූමියෙහි වාසය කරන්නාවූ සත්ව ජාතීන්ගේ ප්‍රමාණය අනන්තය අප්‍රමාණය. උද්දච්ච සම්ප්‍රයුක්ත අකුසල චිත්තය හැර සෙසු එකොළොස් අකුසල කර්මයන්ගේ ශක්තියෙන්ම අපායෙහි පහළ වන්නාවූ අනෙක ප්‍රකාර ශරීර ඇත්තාවූ සත්වයන් අතර හත්සියයක් යොදුන් දිග ඇත්තාවූ "ආනන්ද" නම් මත්ස්‍යාදී මත් ශරීර ඇත්තාවූ සත්වයෝද, මසැසට නොපෙනෙන්නාවූ කුඩා සත්වයෝද, ඒ ඒ යෝනියට සුදුසු පරිදි උපදනාහුය. එම සත්වයන්ගේ නාම කාය උපෙක්ඛා සහගත සන්තිරණ සිතින්ද රූප කාය යෝනියෙන්ද හටගන්නා බැවින් ඒ ඒ යෝනියෙහි ඇත්තා වූ ස්වභාවයෙන්ම ඒ සත්වයාගේ ශරීර සටහන් හටගන්නේය. මොවුන්ගේ භවංග චුති චිත්තයොද එම උපෙක්ඛා සන්තිරණ සිතමය.

තවද ඉහතින් පෙන්වා දුන් නිරයන්හි ආයු ප්‍රමාණයන් දක්වා තිබුණත් එහි උපදින සත්වයන්ගේ අකුශල පාප කර්මය ගෙවා අවසන් වන තෙක් එයින් මිදීමක් නම් නොවන්නේය. කල්ප විනාශයේදීත් පිටසක්වල නිරයන්හි ඉපිද නැවත කල්පය සෑදී එකි එකි අපායන් බිහිවූ කල නැවත තිබෙන පාප කර්මයට අදාල නරකයෙහි උපදින්නේය.

තිරිසන් ආත්මයන්හි උපන්නාවූ සත්වයන් අතර කල්පායුෂ්ක වූ මහානාගරාජයෝද සිටින්නාහ. එසේම වැසිකිලි කුණු කසල ගොම අසූචි අපිරිසිදු ජලාස මළකුණු ආදියෙහි උපදින්නාවූ දවස් හතකට

වඩා ආයුෂ නැත්තාවූ පණුවන් ආදී සත්ව වර්ගයෝද ඇත්තාහ. තවද සතර අපායෙහි උපදින සත්වයන් අතුරින් නිරයන්හි පහළවන්නාවූ සත්වයෝ ඕපපාතිකවම පහළ වන්නාහුය. එසේ වන්නේ කර්මජ තෙජෝ ධාතුව අධික හෙයින් අණ්ඩජ, ජලාබුජ - සංසෙදජ යන යෝනිවලට ඔරොත්තු නොදෙන නිසාය. තවද ඉතා දීර්ඝ කාලයක් නරකයන්හි මහත් දුක්විඳ එයින් මිදී මනුෂ්‍ය මව්කුසක එවන් ප්‍රාණියෙක් පිළිසිඳ ගත් දවසේ සිට එම දරුවා බිහිකරන තුරු මහත් දැවිලි වේදනාවෙන් යුතුව මව කාලය ගෙවන්නේය.

# අභිවන්දන

කල්ප ගණන් පිරූ පෙරුමන් බලෙනි අමා
තුසිත ලොවින් බැස අඩිතාලමක් දමා
සඳහම් දියෙන් නහවන්නට ලොවම තෙමා
ලොව මහ විප්ලවය බුදුහිමි උපත තමා

සුදොවුන් රජුගේ මහමායා බිසව කුස
කාලය විහින් පිළිසිඳ ගෙන වෙසක් මස
දසමස් ගෙවා ලුම්බිණි සල් උයන දෙස
මගේ බුදුපියා ඉපදුනෙ හැර සියලු දොස

සිපගෙන හිමාලයෙ කඳු මුදුනෙහි පවනින්
බුදුවුණු ගයාවේ ඉම්හිරි බෝ සෙවණින්
වදහළ මිහිර මිගදායේ දම් වදනින්
තුන්ලොව දනො වැදගති හොඳ සිහි නුවණින්

අබිවන්දනය පිණිසයි හිස නැමෙන් නේ
සිතුවිලි තුළින් නව අදහස් ගෙනෙන් නේ
කෙලෙසුන් ඉවත් වන ලෙස මම යදින් නේ
සිහිනෙන් වුවද බුදු හිමි රුව පෙනෙන් නේ

මුද්‍රණය :

සක්වා ප්‍රින්ටර්ස්
SAKVA PRINTERS
අංක 51/A, කුලරත්න පාර, අම්බලන්ගොඩ.
Tel / Fax : 091-2258756